# ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම මෙහෙයවන

පළමු වාර පරීක්ෂණය - 2020

8 ශ්‍රේණිය | ක්‍රිස්තියානි ධර්මය | කාලය පැය දෙකයි

1 කොටස

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. දේව මැවිල්ල තුල අසම සම ස්ථානයක් හිමිවන්නේ,
 1. ගස්වැල්වලටය 2. සතුන්ට ය 3. ග්‍රහවස්තුන්ටය 4. මිනිසාටය

02. ස්වභාව ධර්මය අපගේ ජීවිතවලට සමීප කළේ,
 1. සතුන්ය 2. ගස්වැල්ය 3. දියඇළිය 4. දෙවියන්වහන්සේය

03. දෙව්පියා මිනිසාට ලබා දුන් වගකීමක් නොවන්නේ,
 1. පොළොව පාලනය කිරීම 2.සතුන් ආරක්ෂා කිරීම 3. එකිනෙකා සමග තරහ වීම 4. භූමිය රැක ගැනීම

04. සර්පයාගෙන් සංකේතවත් කරන්නේ කුමක්ද?
 1. කරුණාව 2. නපුර 3. දයාව 5. ප්‍රේමය

05. "හොඳ නරක අවබෝධකර ගැනීමේ ගසෙන්" සංකේතවත් වන්නේ,
 1. ස්වභාවික පරිසරය 2. දේව සැලැස්ම 3. මිනිස් කැමැත්ත 4. දේව කැමැත්ත

06. දෙවියන්වහන්සේ මිනිසාට ලබා දුන් වැදගත්ම වරප්‍රසාදයක් වන්නේ
 1. ඇඳුම් සීදා දීම 2. උයනින් නෙරපා දැමීම 3. ප්‍රශ්න ඇසීම 4. තෝරා ගැනීමේ නිදහස ලබාදීමයි

07. දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට දුන් නිදහසින් අයුතු ලෙස භුක්ති විඳීමේ ප්‍රතිඵලය වන්නේ,
 1. පාපය වැළඳ ගැනීම 2. ජීවනය උරුම වීම 3. සදාකාලික ජීවනය ලැබීම 4. ආයුෂ වැඩි වීම

08. පාපය තුලින් නග්න භාවයට පත් වූ මනුෂ්‍යාට ප්‍රේමණීය දෙව්දුන් ඇඳුම් දුන්නේ කුමකින්ද?
 1. හණ රෙදි වලින් 2. ගස්වැල්වල අතු වලින් 3. සතුන්ගේ සම්වලින් 4.ගස්වැල්වල පට්ටා වලින්

09. වහල්කමෙන් පීඩා විඳි සෙනඟව නිදහස් කර දීමට නායකයෙක් ලෙස දෙව්දුන් තෝරා ගත්තේ කවුද?
 1.නෝවා 2. සාවුල් 3. දාවිත් 4.මෝසෙස්

10. මෝසෙස් සෙනග සමග පොරොන්දු දේශයට යන ගමනේදී රාත්‍රියේදී මග පෙන් වූයේ කුමකින්ද?
 1 චන්ද්‍රයා 2. දේවදූතයන් 3.ගිනි ටැඹ 4. වලා ටැඹ

11. මෝසෙස් සමග පිටත් වූ ජනතාවට ජලය බිමටනොහැකි ලෙස කරදිය මිශ්‍රව තිබූ ස්ථානය වන්නේ,
 1. රතු මුහුද 2. රෙපිඩිම් 3. සීනායි 4. මාරා

12. ගලීල මුහුද හැඳින් වූ තවත් නමකි,
 1. නාසෙරෙත් විල 2. බෙත්සයිදා පොකුණ 3. ගෙනසෙරෙත්විල 4. මළ මුහුද

13. ඉශ්‍රායෙල් ජනතාවට කාන්තාර ගමනේදී ලබා දුන් ආහාරයක් වන්නේ,
 1.රෝටි 2. මන්නා 3. මස් 4. තිත්ත පලා

14. කිතුණු අපගේ ජීවිතවල පරමාදර්ශය වන්නේ,
 1. ජන නායකයෝය 2.පූජකයන්ය 3. ගුරුතුමන්ය 4. ජේසුස්වහන්සේය

15. තරිඳු ඔබේ පන්තියේ මිතුරෙකි. දිවා ආහාරය නොගෙනෙන එන නිසා විවේක කාලයේ දි ඔහු පන්තියෙන් එළියට යයි. කිතුනු දරුවෙකු ලෙස එහිදී ඔබට කළ හැකි වන්නේ,
 1. ඔහු සමග සුහදව කා කිරීමය 2. මිතුරන්ට ඔහු ගැන පැවසීමය
 3. ඒ පිළිබඳ ගුරුතුමියට දැන්වීම 4. ඔබේ ආහාරය ඔහු සමග බෙදා ගැනීමය.

16. පවුලක් වශයෙන් ජීවත් වීමෙදි ලබන විශේෂ වටිනාකමක් නොවේ.
1. පරිත්‍යාගය 2. ගැටුම් ඇති කර ගැනිම 3. ආදරය 4. රැකවරණය

17. ඉශ්‍රායෙල් සෙනග මිසර හමුදාවෙන් ගැලවීමට දෙවිඳුන් රැගෙන ගියේ මේ මැදින්ය.
1. කළු මුහුද 2. ගලීල මුහුද 3. රතු මුහුද 4. මළ මුහුද

18. ජේසුස්වහන්සේ අපගේ,
1. යහපත් බැටළු එඩේරාය. 2. නපුරු දෙවි කෙනෙකි 3. නාඳුනන කෙනෙකි 4. භිය උපදවන්නෙකි

19. මනහර දේව නිමැවුම දිනෙන් දින විනාශයට පත් වෙමින් පවතී. ඊට හේතු වී ඇත්තේ,
1.ස්වභාවික ව්‍යවසනයන්ය 2. දේව ශාපයයි 3. මිනිසාගේ ආත්මාර්ථකාමි ක්‍රියාවන් 4. දේවභයයි.

20. මහා සිකුරාදා කිතුණු අපට වැදගත් වන්නේ ඇයි?
1. ජේසුස්වහන්සේ පාවා දිම 2. ජේසුස්වහන්සේ අන්තිම භෝජන සංග්‍රාහය සහභාගි විම
3. ජේසුස්වහන්සේගේ දුක් විඳිම හා කුරුසිපත් විම 4. ජේසුස්වහන්සේ සේවයට කැප වූ දිනය

(ලකුණු 2X20=40)

02. හිස්තැනට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුලින් තෝරා ලියන්න.
( පාපය , යාච්ඤාව , බඳු අය කිරිම, කීකරුකම, යහපත්,පේදුරු , දේව කැඳවීම, ප්‍රේම, තුන් දවසකින්, හතළියක් , සාමය )

1. ඉශ්‍රායෙල් සෙනග කාන්තරයේ වසර ..............ක් පමණ ගමන් කළහ.
2. ජේසුස්වහන්සේ කුරුසපත් වී ..................... උත්ථාන වූ සේක.
3. මිනිසා දෙවිඳුන් ප්‍රතික්ෂේප කර ................ තෝරා ගත් නිසා මිනිසාට මරණය හිමිවිය.
4. දෙවියන්වහන්සේ තම පුත්‍රයා දෙන තරම් මිනිසාට .............. කළ සේක.
5. ජේසුස්වහන්සේ අපට ..........................බැටළු එඩේරාණෝ වේ.
6. දේව මෙහෙවරෙහි විශේෂ කාර්යයක් උදෙසා දෙවිඳුන් තෝරා ගැනිම .................... වේ.
7. මෙතැන් පටන් මිනිසුන් දිනනු ඇතැයි ජේසුස්වහන්සේ .................... ට ප්‍රකාශ කළ සේක.
8. ලෙවි හෙවත් මතෙව් ............................ රැකියාවේ නිරත වූ තැනැත්තෙකි.
9. පූජාවීමට වඩා .......................... දෙවියන්වහන්සේට ප්‍රසන්න වේ.
10. කිතුණුවාගේ අවිය ............................. වයි. (ලකුණු 2X10=20)

11 කොටස

❖ පහත සඳහන් ප්‍රශ්නවලින් ඔබ කැමැති ප්‍රශ්න 04ක් තෝරා පිළිතුරු ලියන්න (ලකුණු 10X4 = 40)

01. "මනුෂ්‍යා දේවමැවිල්ලේ භාරකරු මිස අයිතිකරු නොවේ."
1.දේ මැවිල්ලේ අයිතිකරු ලෙස සිතා ක්‍රියා කරමින් මනුෂයා දේව මැවිල්ලට සිදු කරන හානි 3ක් ලියන්න.
11. දේව මැවිල්ල තුළ ආරක්ෂා කර ගැනිමට ඔබට කල හැකි දේවල් 4ක් ලියන්න.

02. 1. මිසර දේශයේදි ඉශ්‍රායෙල් සෙනගට විදින්නට සිදු වූ වහල්කම් 3ක් ලියන්න.
11. ඔබ ජීවත් වන සමාජය තුළ දරුවන් ලෙස මුහුණ දිමට සිදුවන වහල්කම් 5ක් ලියන්න?

03. 1. දෙවියන්වහන්සේ මනුෂ්‍යායාට කොපමණ ප්‍රේම කළාද?
11. ඔබ දෙවියන්වහන්සේගේ ප්‍රේමය අත් දැක්කාවූ අවස්ථාවක් විස්තර කරන්න.

04. පහත සඳහන් ස්ථානවලදි දේව දරුවෙකු ලෙස ඔබ හැසිරෙන ආකාරය ලියන්න
1. නිවසේදි 2. පාසලේදි 3. දේවස්ථානයේදි 4. බසයේ ගමන් කරන විට

05. 1. ඔබගේ දේවස්ථානයේ පුංචි දරුවෙකු ලෙස ඔබට කළ හැකි සේවාවන් 3ක් ලියන්න.
11. අපගේ රට ගැන යාච්ඤාවක් ලියන්න